# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2002/38 - 2017 ජනවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2017.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2005/පීටී/517.*
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කල්/6/නොරො/තැපැල්/ අත්/692.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සර්වේ ජනරාල්ගේ එෆ්.වී.පී. 3292, අතිරේක අංකය 9 හි, කැබලි අංකය 198 හා 2010.05.04 වැනි දින දරන පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0869ක් පමණ නොරොච්චෝලේ උප තැපැල් කාර්යාලය පිහිටි ඉඩම.

1. **කැබලි අංක 1**

ඉඩමේ නම: කුරවන්කුඩිතෝට්ටම් ; විස්තරය: සර්වේ ජනරාල්ගේ එෆ්.වී.පී. 3292, අතිරේක අංකය 9 හි කැබලි අංකය 198 හා 2010.05.04 වැනි දින දරන පිඹුර; හිමිකම් කියන අයගේ විස්තර: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0869

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව. 11.00 ට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 පෙබරවාරි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එම ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. එම්. එස්. පී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2016 දෙසැම්බර් මස 30 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-140

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2005/පීටී/595.*
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* කල්/ 6 / තලවිල /තැපැල් අත්/693.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සර්වේ ජනරාල්ගේ එෆ්.වී.පී. 3329, අතිරේක අංකය 9 හි, කැබලි අංකය 286 හා 2010.05.04 වැනි දින දරන පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0389 ක් පමණ තලවිල උප තැපැල් කාර්යාලය පිහිටි ඉඩම.

1. කැබලි අංක 1

ඉඩමේ නම: තෙලියතෝට්ටම් හෙවත් ශාන්ත ආනා දේවස්ථාන වත්ත; විස්තරය: සර්වේ ජනරාල්ගේ එෆ්.වී.පී. 3329, අතිරේක අංකය 9 හි කැබලි අංකය 286 හා 2010.05.04 වැනි දින දරන පිඹුර; හිමිකම් කියන අයගේ විස්තර: ගරු රදගුරුතුමා, බිෂොප් නිවස, හලාවත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0389

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව. 09.00 ට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 පෙබරවාරි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එම ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. එම්. එස්. පී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2016 දෙසැම්බර් මස 30 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.